චක්‍රලේඛ අංක: 22/2012

මගේ අංක : ඩබ්/08/බලපත්‍ර/2012
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2012.08.03

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ
සහකාර බන්ධනාගාර අධිකාරින වෙත,

**<u>බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම,</u>**
**<u>නිදහස්වීමට ඉදිරියට අවුරුදු 02 කට අඩු කාලසීමාවක් ඇති</u>**
**<u>සිරකරුවන්ගේ විස්තර කැඳවීම</u>**

සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමට අදාලව මගේ අංක: ඩබ්/08/බලපත්‍ර හා 2011.12.05 දිනැතිව නිකුත් කර ඇති අංක : 25/2011 චක්‍රලේඛය හා බැඳේ.

02. ඉහත කී චක්‍රලේඛය පරිදි සුභසාධක නිළධාරින් විසින් බලපත්‍ර මත මුදාහැරීම සලකා බැලීම සඳහා බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන සමාජ වාර්තා ගොනු අතරින් වැඩිම ප්‍රමාණයක් ස්ත්‍රී දූෂණ චෝදනා සහිත නිදහස් වීමට ඉතා දිර්ඝ කාලයක් ඇති සිරකරුවන් වීම සම්බන්ධයෙන් 2012.07.27 දින පැවති බලපත්‍ර මණ්ඩලයේදී දිර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය කෙරිනි. මේ තත්වය නිසා එකී සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමට නොහැකිවීම ගැටළු සහගත තත්ත්වයක් බවට පත්ව ඇත.

03. එබැවින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගැනිම සඳහා ඔබ ආයතනයේ රඳවා සිටින ඉහත සඳහන් කල චක්‍රලේඛයෙන් සුදුසුකම් ලබා ඇති, නිදහස් වීමට ඉදිරියට අවුරුදු 02 කට අඩු කාලසීමාවක් ඇති සිරකරුවන්ගේ විස්තර සහිත නාමලේඛණයක් (චෝදනාවද සහිතව) වහාම එවීමට කටයුතු කරන ලෙසටත්, මින් ඉදිරියට සෑම මසකම 10 වෙනි දිනට පෙර එම නාමලේඛනය ඉදිරිපත් කිරීමටත් වගබලාගත යුතුය.

04. මේ වනවිට ඔබ ආයතනයේ රඳවා සිටින ඉහතකී කාල පරිච්ඡේදයට ගැනෙන සිරකරුවන් සම්බන්ධයෙන් සැකසෙන බලපත්‍ර ගොනු පවති නම් කඩිනමින් ලේකම්, බලපත්‍ර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසට ඔබගේ සුභසාධක නිලධාරින්ට උපදෙස් දෙන ලෙසටත්, මේ සම්බන්ධව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසටත්, වැඩිදුරටත් දන්වමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස ජනරාල්